[නිල නොවන පරිවර්තනය]

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණයේදී ය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 සහ 126 වන ව්‍යවස්ථා ප්‍රකාරව යාචිත අයදුම්පතක් සම්බන්ධවයි.

ශ්‍රේෂ්ඨාධිකරණ මූලික අයිතිවාසිකම් පෙත්සම් අංක 221/2009

(S.C.F.R. No. 221/2009)

**ආචාර්ය අජිත් සී. එස්. පෙරේරා**

ප්‍රධාන විදායක/ ප්‍රධාන ලේකම්,

"ඉදිරිය", අංක 18/1, ආතර් පෙදෙස,

දෙහිවෙල.

**පෙත්සම්කරු**

**එදිරිව.**

**67. ගරු නීතිපතිවරයා**

නීතිපති දෙපාර්තමේන්තුව,

කොළඹ12.

සහ තවත් 66 දෙනෙක්

**වගඋත්තරකරුවන්**

**S.C.F.R. No. 221/2009**

| | | |
|---|---|---|
| ඉදිරිපිටදී ය | : | ජේ.ඒ.එන්. ද සිල්වා අගවිනිසුරු,<br>අමරතුංග විනිසුරු,<br>ශ්‍රීපවන් විනිසුරු යන විනිසුරුවරුන් |
| **නීතීඥවරුන්** | : | පෙත්සම්කරු තමා වෙනුවෙන් පෙනී සිටි අතර වගඋත්තරකරුවන් වෙනුවෙන්<br><br>නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් ඉන්දිකා දේමුණි ද සිල්වා පෙනී සිටියා ය. |
| **වාචික දේශන හා**<br>**තීන්දුව ප්‍රකාශ කිරීම** | **:** | 2011 අප්‍රේල් 27 |

<u>ගරු අගවිනිසුරු ජේ.ඒ.එන්. ද සිල්වා,</u>

මෙම නඩුව 2009 ක්වූ 10 වන මස 14 වන දිනැති තීන්දුව තවදුරටත් පැහැදිලි කිරීමේ අරමුණින් කැඳවනු ලැබේ.

සියලු පාර්ශවයන්ගේ තර්ක විමසීමෙන් අනතුරුව, 2009 ක්වූ 10 වන මස 14 වන දින ලබා දෙන ලද තීන්දුව අධිකරණය විසින් මතු සඳහන් තීන්දුවෙන් ප්‍රතිස්ථාපනය කරනු ලැබේ:

මිනිසුන්ට නිදහසේ සංචරණයේ හැකියාවේ විවිධ මට්ටම් පවතින බව මෙම අධිකරණය පිළිගන්නා අතරම, ඉතා විශාල සංඛ්‍යාවක් විශේෂයෙන්ම වැඩිවෙමින් පවතින ජ්‍යෙෂ්ඨ පුරවැසියන්, ආබාධ සහිත තැනැත්තන් හා ගර්භණී මවුවරුන් යාම් ඊම් වලදී සීමාවලට මුහුණ දෙන බව ද මෙම අධිකරණය පිළිගනියි.

එසේම, සංශෝධිත 1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත හා එම පනත යටතේ පනවනු ලැබ ඇති රෙගුලාසි ප්‍රකාරව කිසිඳු තැනැත්තෙක් තමාගේ ආබාධ සහිත භාවය යන පදනම මත වෙනස්කොට සැලකීමකට ලක් නොවිය යුතු අතර එම තත්ත්වය හේතුවෙන් එදිනෙදා ජීවිතයේ දී මානව-නිර්මිත පොදු ගොඩනැගිලි, පොදු ස්ථාන හා එම ස්ථාන වල සපයා ඇති පහසුකම් වෙත ප්‍රවේශ වීමේ, ආරක්ෂාවේ හා වාසය කිරීම සම්බන්ධයෙන් ඔවුන්ට වන සහජ අයිතිය සමානව භුක්ති විඳීමට බාධා වන අයුරින් ඔවුන්ගේ සංචරණය සීමා නොකළ යුත්තේය.

ඒ අනුව, මෙතැන්සිට සියලුම නව පොදු ගොඩනැගිලි හා පොදු ස්ථාන විශේෂයෙන් වැසිකිළි හා සේදීම් පහසුකම් සලසන ස්ථානයන් සංශෝධිත 1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත යටතේ පනවනු ලැබ ඇති 2006 අංක 1 දරණ ආබාධ සහිත සහිත තැනැත්තන් පිළිබඳ (ප්‍රවේශ) නියෝගයන්හී අර්ථ දක්වා ඇති ආකාරයට දැනට බලාත්මක රෙගුලාසීන්හි 'සැලසුම් අවශ්‍යතා'වන්ට අනුකූල වන ආකාරයෙන් සැලසුම් කිරීම හා ඉදිකිරීම කළ යුතු බව මෙම අධිකරණය විසින් තවදුරටත් නියෝග කෙරේ.

එසේම, ගොඩනැගිලි සැලසුම් සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා, ඉදිකිරීම අවසන් කරන ලද ගොඩනැගිලි සඳහා අනුමැතිය ලබා ගැනීම හා ඉදිකිරීම් අවසන් කරන ලද ගොඩනැගිලි සඳහා අනුකූලතා සහතික නිකුත් කිරීම සඳහා මෙම අධිකරණ නියෝගයට අනුකූලව ක්‍රියාකිරීම අනිවාර්ය වේ. එබැවින් එම බලතල ක්‍රියාත්මක කරන සියලුම බලාධිකාරීන් විසින් මේ සම්බන්ධයෙන් සමාන වගකීමක් දරන ගොඩනැගිලි හිමිකරුවන් ද සමඟ මෙම නියෝගය උල්ලංඝනය කරන සියලු නව ඉදිකිරීම් සඳහා අනුමැතිය ලබා දීම, අනුකූලතා සහතික නිකුත් කිරීම ආදිය කිරීමෙන් වැළකී සිටිය යුතුය.

**S.C.F.R. No. 221/2009**

මෙම අධිකරණ තීන්දුව අනුගමනය කිරීමට අපොහොසත් වීම දඬුවම් ලැබිය හැකි බරපතල වරදක් වන අතර නීතියෙන් දක්වා ඇති ආකාරයේ දඬුවම් වලට යටත් වීමට සිදු වේ.

මෙම නඩු කටයුතු මෙයින් අවසන් කරනු ලැබේ. පසුව අලුතින් සිදු වන උල්ලංඝනයකදී එම තත්ත්වය සම්බන්ධයෙන් එම අවස්ථාවේදී කටයුතු කරනු ලැබේ.

අගවිනිසුරු

<u>අමරතුංග විනිසුරු</u>

**මම එකඟ වෙමි.**

**ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු**

**ශ්‍රීපවන් විනිසුරු**

**මම එකඟ වෙමි.**

**ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු**